// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1733/47 - 2011 නොවැම්බර් 25 වැනි සිකුරාදා - 2011.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/81.

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2011 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1994 අගෝස්තු මස 31 වැනි දින අංක 834/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ආහාර (පාන් ප්‍රමිති) රෙගුලාසි 1994, නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

(1) එම නියෝගයේ 01.2 නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ඃ

" 01.2 විකල්ප සංඝටක විය යුත්තේ ඃ

(අ) සීනි ;
(ආ) කිරි සහ කිරි නිෂ්පාදන ;
(ඇ) මඤ්ඤොක්කා පිටි, හාල්පිටි, කුරක්කන් පිටි, බඩ ඉරිඟු පිටි, සෝයා පිටි, අර්තාපල් පිෂ්ඨ හා වෙනත් යම් කෑමට ගන්නා පිටි වර්ග සහ කෑමට ගන්නා තෙල් ඇට වර්ග ;
(ඈ) ග්ලූටන් පිටිවල මුළු ප්‍රමාණයෙන් සියයට දෙකක් නොඉක්මම වන පරිදි ;
(ඉ) විටමින් B1, නිකොටිනික් අම්ල හෝ නිකොටිනමයිඩ් හයිඩ්‍රෝක්ලෝරයිඩ් ප්‍රතිශතය පිටිවල මුළු ප්‍රමාණයෙන් 0.25 නොඉක්මවන පරිදි,
(ඊ) මෝල්ට් නිෂ්පාදන, පිටිවල මුළු ප්‍රමාණයෙන් සියයට දෙකක් නොඉක්මවන පරිදි ; සහ
(උ) අවසරලත් කල්තබා ගැනීමේ ද්‍රව්‍ය," සහ

(2) එහි 02.4 වැනි නියෝගයේ අවසානයට, පහත දැක්වෙන අලුත් නියෝගය එකතු කිරීමෙන් ඃ

"3. පාන් ගෙඩියක් පිළියෙළ කිරීමේදී, 01.2 නියෝගයේ සඳහන් යම් විකල්ප පිටි වර්ගයක් එකතු කිරීමේ දී සහ එකතු කළ විකල්ප පිටි වර්ගයේ ප්‍රතිශතය බර අනුව 10%ට වඩා අඩු නොවන අවස්ථාවකදී, පාන් ගෙඩිය එම විකල්ප පිටි වර්ගයේ නමින් සඳහන් කරනු ලැබිය හැකි ය."

12-443

1A - G 15334— 3,335 (2011/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.